සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020(I)**

| කාලය: පැය 03 | අපරාධ නීතිය හා සාක්ෂි නීතිය - (01-III) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>........................................ |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

---

1. i. නිමල් රජයේ කාර්යාලයක කළමනාකරණ සේවා නිලධරයෙකි. ඔහු ගිණුම් අංශයේ මුදල් භාර සරප්වරයාගේ රාජකාරි ආවරණය කරයි. එවැනි එක් අවස්ථාවක දී කාර්යාලය වෙත රජයේ ආදායම් ලෙස ලැබුණු මුදල් මාසයක් පමණ කාලයක් රජයේ ගිණුමකට බැර නොකර ඔහුගේ පෞද්ගලික ගිණුමේ තැන්පත් කර තබාගෙන ඇති බව විගණනය මගින් අනාවරණය වී ඇත. නිමල් පවසා සිටින්නේ අධික වැඩ රාජකාරී නිසා ඔහුට මේ මුදල් පිළිබඳව අමතක වූ බවත්, එම මුදල් පසුව රජයට අයත් ගිණුමේ නිවැරදිව තැන්පත් කර ඇති බවත් ය.

   දණ්ඩ නීති සංග්‍රහය අනුව නිමල් විසින් සිදු කර ඇති වරද පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ii. අජිතා මිල අධික උසස් වර්ගයේ හුරුබුහුටි බලු පැටවකු සුරතල් සතෙකු ලෙස ඇති කිරීමට තම නිවසට ගෙන ආ අතර, අජිතාගේ අසල්වැසි නිවසේ පදිංචි සජිතා ද සුරතල් සතුන් සඳහා දැඩි කැමැත්තක් ඇති තැනැත්තියකි.
   දිනක් අජිතා නිවසේ නොමැති අවස්ථාවකදී එහි පැමිණි සජිතා, අජිතාගේ සුරතල් බලු පැටවා ඉතා ප්‍රිය කරන ආහාර වර්ගයක් ඌට ඉව කිරීමට සලස්වා තම නිවස වෙත ගමන් කළාය. ආහාර වර්ගයට ප්‍රිය වූ බලු පැටවා අජිතාගේ නිවසේ සිට සජිතාගේ නිවස දක්වා දිවෙන මාවතේ ඇය පසුපසින් ගමන් කිරීම ආරම්භ කරමින් සිටිය දී තම නිවස වෙත පැමිණෙමින් සිටි අජිතා ඒ බව දුටුවා ය. පසුව ඇය සජිතා විසින් තම බලු පැටවා සොරකම් කළ බවට සජිතාට චෝදනා කර ඒ බව පොලීසියටද පැමිණිලි කළාය. නිවසේ CCTV දර්ශන පරීක්ෂා කිරීමේ දී සජිතා බලු පැටවාට ආහාර වර්ගයක් ඉව ඇල්ලීමට දීමේ දර්ශනය පැහැදිලිව දක්නට ඇත.

   දණ්ඩ නීති සංග්‍රහය යටතේ සජිතා අපරාධයක් සිදු කර තිබේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

2. i. සාක්ෂි ආඥාපනත අනුව "සාක්ෂි" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. අධිකරණ කටයුත්තක දී සාක්ෂි විමසන පිළිවෙළ එහි පියවර නිශ්චිතව දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

3. I. පහත සඳහන් මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.

අ. උත්තරය අඟවන ප්‍රශ්න (Leading questions) (ලකුණු 05)

ආ. සහතික කරන ලද පිටපත්වල නිර්මාතෘත්වය පිළිබඳ පූර්ව නිගමනය (Presumption as to genuineness of certified copies) (ලකුණු 05)

II සාක්ෂිකරුවන් විමසීමේ දී කරුණු සිහිපත් කිරීම (Refreshing memory) යන්න උදාහරණයක් සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

4. i. දණ්ඩ නීති සංග්‍රහය අනුව "අනුබලදීම" යන වරද පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. අජිත් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් සැරයන් ජයසුන්දර මහේස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තුවක් ලබා ගනියි. එම අවස්ථාවේ අධිකරණයේ රැඳී සිටි අජිත්ගේ සොහොයුරු සුජිත් මේ බව දැන ගනියි.
පොලිස් සැරයන් ජයසුන්දර, අජිත්ව අත්අඩංගුවට ගැනීමට පැමිණි අවස්ථාවේ දී සුජිත් තමන් අජිත් බව හඟවා පොලිස් අත්අඩංගුවට පත්වෙයි.

අ. අජිත් මෙහිදී වරදක් සිදු කරයි ද?

ආ. සුජිත් මෙහිදී වරදක් සිදු කරයි ද?

ඇ. පොලිස් සැරයන් ජයසුන්දර මෙහිදී වරදක් සිදු කරයි ද?

ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 4x3= 12)

5. පහත සඳහන් දේපල සම්බන්ධ වැරදි පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. සොරකම (Theft)

ii. කොල්ලකෑම (Robbery)

iii. අනර්ථය (Mischief)

iv. සාපරාධී අයුතු ඇතුළුවීම (Criminal Trespass)

(ලකුණු 5X4 = 20)

*************